# ධ්‍යාන සමාපත්ති විෂයෙහි සමකාලීන දර්ශනවාද අතර බුදුදහම තබා ඇති ඉදිරි පියවර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි**[1]

පුද්ගල සන්තානයෙහි පවත්නා ක්ලේශ ධර්ම විනාශ කොට නික්ලේශී පවිත්‍ර පුද්ගලයකු නිර්මාණය කිරීම බෞද්ධ ප්‍රතිපදාවේ මූලික අරමුණ යි. බුදුදහම ධ්‍යාන සමාපත්ති හඳුන්වා දෙන්නේ ද එකී අරමුණ ඉටුකර ගැනීම පිණිස ය. එහි ලා තත්කාලීන භාරතයේ පැවති සියලු ආගම් හා දෘෂ්ටිවාද අබිබවමින් බුදුදහම ඉදිරි පියවරක් තබයි. භාවනා ක්‍රම, විද්‍යා, ශික්ෂා, අභිඥා හා සමාපත්ති යන විෂයයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඒ බව මැනවින් පැහැදිලි වෙයි. වෙනත් දර්ශනවාද භාවනා ක්‍රම එකක් හඳුන්වා දෙන විට බුදුදහම දෙකක් හඳුන්වා දී ඇත. එසේ ම ත්‍රිවිද්‍යාවල දී වෙනත් ශාසනවල විද්‍යා දෙකක් හඳුන්වා දෙන විට බුදුදහම ආසවක්ඛය ඤාණය නමින් නව විද්‍යාවක් හඳුන්වා දෙයි. ත්‍රිශික්ෂාවල දී බුදුදහම ප්‍රඥා අංගය ඉදිරිපත් කරමින් නව පියවරක් තබා ඇති අතර අනෙක් දර්ශනයන්ට අනුව ඇත්තේ ශීල හා සමාධි යනුවෙන් ශික්ෂා දෙකක් පමණි. ශ්‍රමණ සම්ප්‍රදායන්හි පැවති පඤ්ච අභිඥාවන්ට බුදුදහමේ දී ආසවක්ඛය ඤාණය එකතුවීමෙන් ෂළභිඤ්ඤා බවට පත් වෙයි. සමාපත්ති 8ක් පිළිබඳ ව බොහෝ ග්‍රන්ථවල සඳහන් වන අතර ඒවා අෂ්ට සමාපත්ති නාමයෙන් ව්‍යවහාර වෙයි. මෙම අෂ්ට සමාපත්ති රූපාවචර හා අරූපාවචර යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. බුදුදහම ඉදිරි පියවරක් තබමින් නවවැනි සමාපත්තියක් හඳුන්වා දෙන අතර සාමාන්‍ය පුද්ගලයන්ට විෂය නො වන ආර්යයන් වහන්සේලාට පමණක් විෂය වන එය සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තිය නමින් හඳුන්වයි.

ධ්‍යාන නමින් ද හඳුන්වනු ලබන සමාපත්තීන් අතර අරූපාවචර සමාපත්තීන්ට වඩා රූපාවචර සමාපත්තීන්ට බුදුදහමෙහි දී විශේෂ ස්ථානයක් හිමි වන බව පෙනේ. බුදුරදුන් බුද්ධත්වයට පෙර

---

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
Email: gptkv@yahoo.com

බෝධිසත්ත්ව අවධියේ දී අරූපාවචර සමාපත්තීන් උපදවාගත් බව සඳහන් වෙයි. එහෙත් නිවන් පිණිස මග එය නො වේ යැයි තේරුම් ගත් බෝසත්හු නැවත මුල සිට ප්‍රධන් වීර්ය වැඩූහ. එහි දී උන්වහන්සේ ආනාපානසතිය වඩා රූපාවචර ධ්‍යාන ලබා ත්‍රිවිද්‍යාව උපදවන්නට සමත් වූහ. ආර්ය මාර්ගයේ දී සම්මාසමාධි යටතේ දක්වෙන්නේ රූපාවචර ධ්‍යාන සතර යි. ප්‍රඥාව උද කර ගත හැක්කේ සම්මාසමාධිය මගිනි. ඒ අනුව අරූපාවචර ධ්‍යාන නිර්වාණගාමී ප්‍රතිපදාවේ දී ප්‍රධාන සාධකයක් නො වේ. බුදුරදුන්ගේ බුද්ධත්වය හා පරිනිර්වාණය යන අවස්ථා දෙකෙහි දී ම රූපාවචර ධ්‍යානයන්ට විශේෂ ස්ථානයක් හිමි වී ඇත. අභිධර්මයේ දී රූපාවචර ධ්‍යාන 05ක් ඉගැන්වුව ද සූත්‍ර පිටකාගත ඉගැන්වීම වඩාත් අර්ථවත් බව පෙනේ. මේ අනුව බුදුදහමේ දී අනෙක් දර්ශනවාදයන්ට වඩා ධ්‍යාන සමාපත්තීන්ට විශේෂ ස්ථානයක් හිමි වී ඇති අතර නිර්වාණගාමී ප්‍රතිපදාවේ දී රූපාවචර ධ්‍යානයන් වඩා ඉදිරි පියවරක් තබා ඇති බව පැහැදිලි වෙයි.

ප්‍රමුඛ පදඃ භාවනා ක්‍රම, විද්‍යා, ශික්ෂා, අභිඥා, සමාපත්ති, ආසවක්ඛය ඤාණය, සම්මාසමාධි, රූපාවචර ධ්‍යාන

**Title:** An Analytical Contribution of Buddhism towards Trances and Absorptions among Contemporary Philosophies

**Keywords:** Meditation methods, Tree fold knowledge, Training, Higher powers, Attainment, Knowledge of the destruction of the cankers, Right Concentration, Material Absorption